# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 90 — 1973 දෙසැම්බර් 14 වැනි සිකුරාදා — 1973.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1785 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1794 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1794 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1798 | විවිධ දැන්වීම ... ... ... | — |


සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරණ ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන සිවිර (සංශෝධන) පනත, 1973 දෙසැම්බර් මස 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| *1. 1974.01.01 සිට 1974.06.30 දක්වා මෙරට සෑදූ විදුලි කම්බි සැපයීම | 74.01.16 |
| 2. මෙරට නිෂ්පාදිත කැන්වස් (ඩෙක්) සපත්තු සැපයීම— | 74.01.11 |
| 3. 1974.01.01 සිට 1974.12.31 දක්වා මෙරට කොට්ට පුළුන් සැපයීම | 74.01.11 |

* විදුලි කම්බි සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පි. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 14 දින,
කොළඹ දී ය.

12–464—73.12.14 දින අංක 90 දරන ගැසට් පත්‍රය

---

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ
### විශෙෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඇ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දැක්වෙන බලවේග ව්‍යාපෘතීන්හි ඇති පලුදුවූ රෙදි පිළි මිළදී ගෙන ඉවත් කැර ගැනීම සඳහා 1974.01.15 වන දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ.

| ව්‍යාපෘතියේ නම | යාර ගණන | අවශ්‍යවෙන් ඩර් තැන් පත් මුදල රු. | ශ. |
|---|---|---|---|
| කෑගල්ල බලවේග ව්‍යාපෘතිය ... | ... 8,194¼... | 525 | 0 |
| කුරුවිට බලවේග ව්‍යාපෘතිය ... | ... 4,549¾... | 225 | 0 |
| ලේවැල්ල බලවේග ව්‍යාපෘතිය ... | ... 15,864⅓... | 725 | 0 |
| කුරුණෑගල බලවේග ව්‍යාපෘතිය ... | ... 12,318½... | 600 | 0 |
| පොල්ගොල්ල බලවේග ව්‍යාපෘතිය | ...7,547 7/12 | 450 | 0 |
| මාතලේ බලවේග ව්‍යාපෘතිය ... | ... 1,816 | 75 | 0 |
| අනුරාධපුර බලවේග ව්‍යාපෘතිය ... | ... 3,907½... | 200 | 0 |
| ගාල්ලේ බටගන්විල බලවේග ව්‍යාපෘතිය | ... 1,196¾... | 100 | 0 |
| නුවරඑළිය බලවේග ව්‍යාපෘතිය ... | ... 12,562¾... | 625 | 0 |

2. ඉහත සඳහන් කැර ඇති එක් එක් ව්‍යාපෘතීන් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන් අනුව නැවත ආපසු දෙනු ලබන ටෙන්ඩර් තැන්පතු මුදල් 1974.01.14 දින දවල් 12 ට හෝ ඉන් පෙර ගෙවීමෙන් පසුව කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ටෙන්ඩර් ආකෘති පත් සහ කොන්දේසි ලබා ගත හැක.

3. වැඩි විස්තර යදහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැන විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1–(5/68).
1973 දෙසැම්බර් 01 දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ,
කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

12–384—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### මුද්දර කවර සැපයීම

මුද්දර කවර සැපයීම සඳහා 1974 ජනවාරි 29 දින පෙ. ව. 10 දක්වා කොළඹ 1, මූලස්ථාන ගොඩනැගිල්ලේ, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටැන්ඩර් භාර ගනු ලැබේ.

2. ටැන්ඩර් විවෘත කරනවිට, ටැන්ඩර්කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ඇත. 1 වැනි ඡේදයේ සඳහන් දිනට හා වේලාවට පෝස්ට් මාස්ටර් ජනරාල් කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

3. කොළඹ 1, ප්‍රධාන තැපැල් කාර්යාලයේ, ගණකාධිකාරි (මුද්දර) කාර්යාලයෙන් ඉල්ලුම් කිරීමෙන් 1974 ජනවාරි 28 දින පෙ. ව. 10 දක්වා ලබාගත හැකි ෆෝරම මගින් ටැන්ඩර ඉදිරිපත් කළ යුතුය.

4. ටැන්ඩර සියල්ල දෙපිටපතකින් තිබිය යුතුය. ටැන්ඩර බහාලන ලියුම් කවරයේ වම්කොනේ "මුද්දර කවර සැපයීම සඳහා ටැන්ඩරය" යන්න ලකුණු කළ යුතුය.

5. ටැන්ඩර, රෙජිස්තර තැපැලෙන් යැවිය යුතුය. මෙරට ටැන්ඩර් කරුවකු මේ ආකාරයට ටැන්ඩරය යැවීමට අකමැතිවේ නම්, ඔහු සිය ටැන්ඩරය ලියුම් කවරයක බහා එහි මතුපිට ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කරන ලද විස්තර සහ ටැන්ඩරකරුගේ නම සහ ලිපිනය ලියා මුද්‍රා තබන ලද එම ටැන්ඩරය පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ ගේ කාර්යාලයට බාරදී එය බාරගත් බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. කොළඹ 1, ප්‍රධාන තැපැල් කාර්යාලයේ 17 වැනි කවුන්ටරයේදී රු. 50 ක ටැන්ඩර් තැන්පතුවක් කළයුතු අතර, ටැන්ඩර් ආකෘති පත් ලබාගැනීමට කලින් ඒ පිළිබඳව කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. 1974 ජනවාරි 28 දින පෙ. ව. 10 දක්වා ටැන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

7. නියමිත පරිදි සැම්පල් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම දෙපාර්තමේන්තුව, අමුද්‍රව්‍ය සඳහා කිසිම ආනයන බලපත්‍ර යක් නිකුත් කිරීමට නිර්දේශ නොකරන හෙයින්, එම ද්‍රව්‍ය ආනයන කිරීම සඳහා ආනයන බලපත්‍ර අවශ්‍ය නොවන එවැනි කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ටැන්ඩර් භාරගනු ලැබේ.

9. තවදුරටත් විස්තර සහ කොන්දේසි, කොළඹ 1, ප්‍ර. තැ. කාර්යාලයේ ගණකාධිකාරි (මුද්දර) වෙත ඉල්ලුම් කිරීමෙන් ලබා ගත හැක.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැ. සහ වි. මූලස්ථානය,
කොළඹ 1.

12–456—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු බඩු විකිණීම

මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සන්දේශ ගබඩාවේ තබා ඇති සේවයට නුසුදුසු බඩු විකිණීම සඳහා, කොළඹ 1 තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානයේ 5 වන මහලේ, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයේ, ගැනුම්පත් මංඩල සභාපති විසින් 1974 ජනවාරි 10 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානයේ 5 වැනි මහලේ, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත් ෆෝරම්වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. තැපැල් කාර්යාලයක, තැපැල් ස්ථානාධිපති වෙත හෝ කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ, විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සිය ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු වෙත ඉදිරිපත් කිරීමෙන් 1974 ජනවාරි 04 දින දහවල් 12 වන තෙක් බලාපොරොත්තුවන ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගත හැකි වේ.

එච්. ඩී. ඇස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලය,
තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානය,
5 වන මහල, ලෝටස් පාර,
කොළඹ 1.

12–468—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවි පලවල ලෙලි පොල් විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973. 12. 31 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

බතලගොඩ ගොවිපලේ විකිණීමට තිබෙන ලෙලි පොල් ගෙඩි ගණන —19,000ක් පමණ.

වාරියපොල ගොවිපලේ විකිණීමට තිබෙන ලෙලි පොල් ගෙඩි ගණන—15,000ක් පමණ.

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළත දී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල එක වර ගෙවා පොල් තොගය භාරගෙන ගොවිපලින් බැහැර කර ගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිළ දී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(ii) පොල් තොගය භාර ගැනීමේ දී කිසිම පිළිවෙලකට වර්ගී කිරීමකට ඉඩ නැත. එමෙන් ම පුහු වූ හෝ කුණු වූ හෝ කුඩා වූ හෝ වශයෙන් වර්ගී කිරීමකට ද ඉඩ නැත.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබා ගන්නා ලද ෆෝරම්වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වේනොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එව්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 28.12.73 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු අධිකාරී ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නාසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිරි/2/460
ඉඩම් සංවර්ධන දෙපර්තමේන්තු කාර්යාලය,
කොළඹ,
1973 දෙසැම්බර් 4.

12–390—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින්, පහත සඳහන් වැඩ සඳහා 1973 දෙසැම්බර් මස 28 වෙනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත් කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|
| | රු. ශ. |
| (1) මාතර බිසෝවේ ගොඩනැගිලි, පාර වල් සහ අංගනය තැනීම—ඉසි/502 ... | 225,000.00 |
| (2) අලව්ව බිසෝවේ පස් වැඩ, ගොඩනැගිලි, පාරවල් සහ අංගනය තැනීම—ඉසි/585 ... | 50,000.00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල, පිළියෙලකොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාළ සැලසුම් ආදිය ඔහුගේ කායසීලයේදී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංසථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක 1 සඳහා රු. 200 ක්ද, අංක 2 සඳහා රු. 100 ක්ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් වැඩ අංක 1 සඳහා රු. 40 ක්ද, අංක 2 සඳහා රු. 25 ක්ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 දෙසැම්බර් මස 27 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

12–381—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 දෙසැම්බර් මස 28 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ ප්‍රධාන ගබඩාකරුගේ ගබඩාවේ තිබෙන හිස් සිමෙන්ති උර 9,706 ක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 දෙසැම්බර් මස 28 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායසීලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ සරප් තැන වෙත තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 දෙසැම්බර් මස 26 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

එස්. එම්. බී. දෙලපිහිල්ල,
වැඩබලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1973 දෙසැම්බර් මස 04 වෙනි දින දී ය.

12–421—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—නැගෙනහිර දිසාව, මඩකලපුව

නැගෙනහිර දිසාවට අයත්, ඉඟිනියාගල, අම්පාර, මහඔය, කල්මුනේ, උන්නච්චේ, මඩකලපුව, චෙන්කල්ලාඩි, මූතූර්, කන්තලේ, ත්‍රිකුණාමලේ සහ ගෝමරන්කඩවල යන එක් එක් විධායක ඉංජිනේරු කොට්ඨාශය වෙනුවෙන් 1974 වර්ෂය සඳහා ප්‍රවාහන රථ වාහන කුලියට ගැනීම සහ ද්‍රව්‍ය ප්‍රවාහන කිරීම් සම්බන්ධයෙන් ලාංකිකයන්ගෙන් සහ ලාංකික ව්‍යාපාර ආයතන වලින් ටෙන්ඩර් පත් මඩකලපුවේ, නැගෙනහිර දිසාවේ, දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 28.12.73 දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

මඩකලපුවේ නැගෙනහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව, එක් එක් කොට්ඨාශය වෙනුවෙන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. එක් කොට්ඨාශය වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25 බැගින් ගෙවූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ආකෘතිපත්‍ර සහ නියමාවලි සහ විශේෂ කොන්දේසිවල පිටපත් 26.12.73 වැනි දින පෙ. ව. 10.00 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩරයේ විශේෂ කොන්දේසි සහ නියමාවලි පිටපත් සැපයීම සඳහා අමතරව රු. 2 ක ගාස්තුවක් ගෙවිය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම කච්චේරියක හෝ, මඩකලපුවේ, නැගෙනහිර දිසාවේ, වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ ඕනෑම කොට්ඨාශ කාර්යාලයක හෝ තැබිය හැකිය.

වැඩි දුරටත් විස්තර වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එන්. ජී. නාමෝදරම්,
වැඩ අධ්‍යක්ෂ, නැගෙනහිර දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
මඩකලපුව, 73.12 4.

12–454—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

### ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සංවිධානය—නැගෙනහිර දිසාව, මඩකලපුව

නැගෙනහිර දිසාවට අයත්, ඉගිනියාගල, අම්පාර මහඔය, කල්මුනේ, උන්නච්චේ, මඩකලපුව, චෙන්කල්ලාඩි, මූතූර්, කන්තලේ, ත්‍රිකුණාමලේ සහ ගෝමරන්කඩවල යන එක් එක් විධායක ඉංජිනේරු කොට්ඨාශය වෙනුවෙන් 1974 වර්ෂය සඳහා ප්‍රවාහන රථ වාහන කුලියට ගැනීම සහ ද්‍රව්‍ය ප්‍රවාහන කිරීම් සම්බන්ධයෙන් ලාංකිකයන්ගෙන් සහ ලාංකික ව්‍යාපාර ආයතන වලින් ටෙන්ඩර් පත් මඩකලපුවේ, නැගෙනහිර දිසාවේ, දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 28. 12. 73 දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

මඩකලපුවේ නැගෙනහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව, එක් එක් කොට්ඨාශය වෙනුවෙන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කල යුතුය.

එක් කොට්ඨාශය වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25 ක් ගෙවූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ආකෘතිපත්‍ර සහ නියමාවලී සහ විශේෂ කොන්දේසිවල පිටපත් 26. 12. 73 වැනි දින පෙ. ව. 10.00 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩරයේ විශේෂ කොන්දේසි සහ නියමාවලි පිටපත් සැපයීම් සඳහා අමතරව රු. 2 ක ගාස්තුවක් ගෙවිය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම කච්චේරියක හෝ, මඩකලපුවේ, නැගෙනහිර දිසාවේ, වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ ඕනෑම කොට්ඨාශ කාර්යාලයක හෝ තැබිය හැකිය.

වැඩිදුරටත් විස්තර වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එන්. ජී. තාමෝදරම්,<br>වැඩ අධ්‍යක්ෂ, නැගෙනහිර දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,<br>මඩකලපුව. 73. 12. 1.

12–4..—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානය

### උතුරු මැද දිසාව—අනුරාධපුරය

**1974 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ප්‍රවාහන වාහන හා පස් කැපීමේ උපකරණ කුලියට ගැනීම පිළිබඳව ටෙන්ඩර් පත් කැඳවීම**

අනුරාධපුර, උතුරු මැද දිසාවේ වාරිමාර්ග විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරු සංවිධානයේ දිසා කාර්යාලයේ ටෙන්ඩර් පත් මණ්ඩලයේ සභාපති විසින්, 1974 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා වූ කාලය සඳහා ඉහත දැක්වෙන වාහන හා යන්ත්‍රෝපකරණ ආදිය කුලියට ගැනීම් සඳහා ටෙන්ඩර් පත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් හා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් යුත් ආයතනවලින් 74. 1. 4 දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. පහත සඳහන් කාර්යාලයේ හෝ ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සංවිධානයේ කුමන කාර්යාලයක හෝ යාපනය, බදුල්ල, හෝ ත්‍රිකුණාමලේ කච්චේරියේ හෝ රු. 50 ක තැන්පත් මුදලක් බැඳීමෙන් ලබාගන්නා ලද රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 73. 12. 31 වන දින ප. ව. 2.30 තෙක් පහත සඳහන් කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර මත ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුය.

3. වැඩි විස්තර අනුරාධපුර උතුරු මැද දිසාවේ වැඩ අධ්‍යක්ෂ ගෙන් ලබා ගත හැකිය.

ජී. එස්. වික්‍රමසිංහ,<br>දිසා වැඩ අධ්‍යක්ෂ—උතුරු මැද දිසාව.

1973 දෙසැම්බර් මස 22 වැනි දින,<br>අනුරාධපුර,<br>වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

12–289—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### රජයේ බෙහෙත් ගබඩාව හිස් භාජන විකිණීම

පහත සඳහන් හිස් භාජන විකිණීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් 1973.12.28 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| ද්‍රව්‍ය අංක | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 ගැලුම් 45, | ස්ප්‍රිතු මූඩි සහිත හිස් පීප්ප | 160 යි. |

2. ඉහත සඳහන් හිස් භාජන මරදාන, පැරණි දුම්රියාංගණයේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ දී සෙනසුරාදා හා ඉරිදා දිනයන් හැර සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 8 සිට ප. ව. 3.30 දක්වා පරීක්ෂාකර බැලීමට පුළුවන.

3. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍රපිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබන කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම්පස උඩ කෙලවරේ "හිස් භාජන විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතු ය.

4. මරදාන ඕන්ස් පාරේ අංක 355 දරන ස්ථානයේ රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩරයට අමුනා එවිය යුතු ය.

5. ටෙන්ඩර් පත්‍ර ඉහත සඳහන් පළමු ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

6. කිසිම ප්‍රයෝජනයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ල හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාර ගැනීමේ හෝ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක්ම නොපිළිපැද තිබුනොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

7. තෝරුනු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුළත දී එම විෂයය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිල ගණන් සම්පූර්ණයෙන්ම රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුළතදී මේ විෂය භාරගෙන රජයේ බෙහෙත් ගබඩා භූමියෙන් ඉවත් කර ගත යුතුය.

8. ඉහත සඳහන් 7 වන ඡේදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ.

9. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මරදාන, ඕන්ස් පාරේ අංක 355 දරණ ස්ථානයේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී ගෙන් ලබා ගත හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,<br>ර. බෙ. ග. අධිකාරී.

මගේ අංකය : කේ සී 8/63<br>1973.11.17 දින, කොළඹ<br>රජයේ බෙහෙත් ගබඩා අධිකාරි කාර්යාලයේ දී ය.

12–363—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### "මෝටර් ලොන්ච් සැපයීම සඳහා ටෙන්ඩරය"

කොළඹ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත දැක්වෙන උපලේඛනයෙහි දැක්වෙන පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතැන වෙත "මෝටර් ලොන්ච්" සැපයීම් සඳහා 1974 ජනවාරි මස 18 වැනි සිකුරාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූලව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය :—

(i) ඉදිරිපත් කරනු ලබන මිල ගණන්හි අඩංගු වී ඇති රුපියලේ වටිනාකම හා විදේශ විනිමය ප්‍රමාණය විස්තර සහිතව සඳහන් කළ යුතුය.

(ii) මිල ගණන. ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමෙන් පසු මාස 2ක කාලසීමාවකට වලංගු විය යුතුය.

(iii) ඉදිරිපත් කරනු ලබන ද්‍රව්‍යයන් :—

(අ) පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විස්තරයන්ට අනුකූල විය යුතුය. කෙසේ හෝ වෙනත් විස්තර අනුව මිල ගණන ඉදිරිපත් කරන්නේ නම් ඒවා සම්පූර්ණ විස්තර සහිතව ඉදිරිපත් කළ යුතුය.

(ආ) පහත සඳහන් උපලේඛනයන්හි සඳහන් කොන්දේසි වලට එකඟව භාරදීම කල යුතුය.

(iv) පහත සඳහන් කරුණු ටෙන්ඩරයෙහි සඳහන් කළ යුතුය :—

(අ) නිෂ්පාදකයාගේ නම හා ලිපිනය :————.

(ආ) නිෂ්පාදිත දිනය :————.

(ඇ) "ලොන්ච්" සැකසුම හා වර්ගය :————.

(ඈ) භාරදීමේ කොන්දේසි :————.

3. ටෙන්ඩර්කරුවන් විසින් තමන් විසින්ම සකස් කල ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කොට කවරවල බහා මුද්‍රා තබා "මෝටර් ලොන්ච් සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් කවරයේ වම් කෙලවර මුදුනේ සඳහන් කොට කොළඹ 10, තැ. පෙ. 584, ඩීන්ස් පාරේ අංක 385 දරණ ස්ථානයෙහි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර ඉහත 3 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ගිණුම් අංශයේ) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ ලේඛනගත තැපෑලෙන් එවීමට පුළුවන. ලේඛනගත තැපෑලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන් තමන්ම හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් සැපයීම් විස්තර නම සහ ලිපිනය සඳහන් මුද්‍රා සහිතව කවරවල බහාලන ලද ටෙන්ඩර් පත් ඉහත 3 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ එවැනි ටෙන්ඩර් බාර ගැනීමට බලය ලත්, ප්‍රධාන ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාරදිය යුතුය. මුද්‍රා සහිත ටෙන්ඩර් භාර දෙනවුන්ට ඔහු විසින් ටෙන්ඩරය භාරගත් බව දැනුම් දීමේ කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. රු. 100ක තැන්පත් මුදලක් කොළඹ ඩීන්ස් පාරේ අංක 355 හි රජයේ බෙහෙත් ගබඩා අධිකාරී කාර්යාලයේ තැන්පත් කල යුතුයි. මුදල් තැන්පත් කල බවට ලද රිසිට් පත ටෙන්ඩරයට ඇමිනිය යුතුය.

6. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා ආපසු ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

7. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හේතු නොදක්වා ඉවත දැමීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. මෙම දැන්වීමෙහි සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ ලෙස පිළිපැද නොමැති කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

8. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත කාලසීමාව තුළදී "මෝටර් ලොන්ච්" සැපයීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලබන අතර, වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු පිණිස බලය ලත් නිලධාරී වෙත වාර්තා කරනු ලැබේ.

9. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඉහත 3 වැනි ඡේදයෙහි සඳහන් ස්ථානයේදී නියමිත දින, නියමිත වේලාවේදී ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම ඉදිරිපත් කර ඇති මිල ගණන් ද පැමිණ ඇති ටෙන්ඩර්කරුවන්ට ප්‍රකාශ කරනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී යම් ටෙන්ඩරයක් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවෙතින් පිළියෙල කර ගත් අවස්ථාවකදී ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත නිරීක්ෂණය කිරීමට ඉඩ දෙනු ලැබේ.

10. තවදුරටත් විස්තර කොළඹ 10 ඩීන්ස් පාරේ අංක 355 දරණ ස්ථානයෙහි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) වෙතින් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

මගේ අංකය : පී. එස්. ඊ. 59/73.

1973 නොවැම්බර් මස 29 දින, කොළඹ
රජයේ බෙහෙත් ගබඩාවේ දී ය.

## SCHEDULE REFERRED TO

### Specifications for a Motor Launch

THE motor launch to be suitable for Passenger/Ambulance service for operation within Colombo Harbour limits and for out-harbour emergency work within territorial limits. Principal dimensions and specifications basically as follows :—

| | | |
|---|---|---|
| LOA | .. | 28′ to 30′ |
| Beam | .. | 7′ to 8′ |
| Draught | .. | 2′ to 3′ |

(i) The launch should be constructed to carry out and provide accommodation for 18-20 passengers and a crew of 3. The launch should be designed with enclosed cabins, having upholstered seating accommodation for the passengers. Also suitable arrangement for accommodating a stretcher.

(ii) Keel, frames, floor, hull, deck and cabin to be of well seasoned wood or fibreglass. In the case of wood, all seams to be uniformly caulked and all plank fasternings to be copper rivets and brass screws. The entire hull up to deck level shall be covered with nylon or fibreglass sheeting. Alternatively, the hull to be of fibreglass and super structure in wood or fibreglass.

(iii) The engine shall be a marine diesel with reversibel gear box fresh water cooled, with a maximum rating of 50 to 55 h.p.

(iv) The boat to have maximum still water speed of about 9 to 10 knots.

(v) Deck fittings and grab rails to be of brass or other suitable anodized material.

(vi) Painting—antifouling below water line and all other parts according to colour requirements including letter and emblem.

(vii) Electrical system wiring and fitting shall conform to standard boat building practice.

(viii) Outfit to include navigation lights, lifebuoys fenders and fire extinguishers.

Tenderers are required to submit detailed specifications and drawings of the launches designed. Each launch shall be built under the survey of the Government Engineers and ships Surveyor Department of Shipping, Colombo.

All work will have to conform to the requirement prescribed by him for this Class of vessel—certificates from the Government Engineer Ships Surveyor would be a pre-requisite for any payments either in part or in full in respect of this contract.

The successful tenderer would be responsible for licensing of the launches obtaining the requisite certificates of sea worthiness on completion, and handing over the vessel in a complete sea-worthy conditions to the Transport Officer—Department of Health, Colombo 1.

12–355—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

1974 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා (මාස 12) තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| සැපයීම්/සේවාවන් | | ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අවසාන දිනය (දහවල් 12 ට) | | ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කරන දිනය (පෙ.ව. 10.00 ට) |
|---|---|---|---|---|
| (1) කොළඹ, දියතලාව ගුවන් හමුද කඳවුරුවලට යාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම | ... | 73.12.27 | ... | 73.12.28 |
| (2) දියතලාව, චීනවරාය ගුවන් හමුද කඳවුරුවලට මෙට්ට, කොට්ට සහ කුෂන් නැවත සකස් කිරීම | | 73.12.27 | ... | 73.12.28 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙන් II වැනි තීරයෙහි දක්වා ඇති දිනයන්හි දහවල් 12.00 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්දිස්,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදාපති.

12-422—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## වී අලෙවි මණ්ඩලය

කොළඹ 5, එලිබැන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ මධ්‍ය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන සේවාවන් සහ ඉදිකිරීමේ කාර්යයන් පිණිස 1973 දෙසැම්බර් මස 28 වන දින වන සිකුරාද ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 5, එලිබැන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ මුදල් කළමනාකරු වෙත සෑම සේවාවක් සහ/හෝ ඉදි කිරීමේ කාර්යයන් සඳහා ටෙන්ඩර් තැන්පත් ගෙවා කොළඹ 5, එලිබැන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ කාර්යාලයේදී, ඒ සඳහා රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පසු ලබාගත හැකි ආකෘති පත්‍ර මත සෑම සේවාවක් සහ/හෝ ඉදිකිරීමේ කාර්යයක් සඳහාම පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. 73.12.27 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් උප ලේඛනයේ දක්වා ඇති සීමාව දක්වා ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් භාර ගැනීම පිළිබඳව රජයේ දෙපාර්තමේන්තුවල සහ සංස්ථාවල ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ''කොන්ත්‍රාත් කරුවන්ගේ වාර්තා පොත්'' ඉදිරිපත් කළ පසු ඉදිකිරීමේ කාර්යයන් සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. මීට අමතර විස්තර කොළඹ 5, එලිබැන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ මධ්‍ය ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් තැනගෙන් ලබාගත හැක. (දුරකථන අංක 83626)

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස්,
සාමාන්‍යාධිකාරී,
වී අලෙවි මණ්ඩලය.

වී අලෙවි මණ්ඩලය,
අංක 5, එලිබැන්ක් පාර,
කොළඹ 5, 1973 දෙසැම්බර් මස 3 වන දිය.

ටෙන්ඩර් උප ලේඛනය

| | ටෙන්ඩරයේ විස්තර | ටෙන්ඩර් ආපසු ගෙවන | | තැන්පත ආපසු නොගෙවන | | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වී සිටිය යුතු සීමාව. | |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| 1. | කොග්ගල වී. අ. ම. ගබඩාව සහ කාර්යාලය අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩරය | 250 | 0 | 10 | 0 | 25,000 | 0 |
| 2. | මඩකලපුවේ කිරන්හි මාර්ගස්ථ ගබඩාවක් ඉදිකිරීම සඳහා ටෙන්ඩරය | 250 | 0 | 10 | 0 | 50,000 | 0 |
| 3. | මඩතඩිහිදී පෙර තනන ලද වී. අ. ම. ගබඩාවක් නැවත ඉදිකිරීම සඳහා ටෙන්ඩරය | 250 | 0 | 10 | 0 | 50,000 | 0 |
| 4. | සිරස් බොයිලර් 11 ක් අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩරය | 100 | 0 | 10 | 0 | — | |
| 5. | ත්‍රිකුණාමල ප්‍රදේශයේ ප්‍රවාහන සේවා සඳහා ටෙන්ඩරය | 100 | 0 | 10 | 0 | — | |
| 6. | අම්පාරේ ප්‍රදේශයේ ප්‍රවාහන සේවා සඳහා ටෙන්ඩරය | 100 | 0 | 10 | 0 | — | |

12–442—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජන රජය

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය ලංකා විදුලි බල මණ්ඩලය

**බෝවතැන්න විදුලි යෝජනා ක්‍රමය සඳහා උපකරණ සපයා සවිකිරීම පිණිස ටෙන්ඩර් කැඳවීම**

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් පහත දක්වෙන කොන්ත්‍රාත්තු සඳහා සීල් තැබූ මිළ ගණන් කැඳවනු ලැබේ :—

(i) විද්‍යුත්-යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 1 නමින් හැඳින්වෙන කොන්ත්‍රාත්තුවට අඩංගුවන්නේ :—

සවිකරන ලද කොටස් ඇතුළු කුණුරොඩු රඳවන රාමු සහ ගේට්ටු රැඳවුම් කණු සැපයීම හා ශ්‍රී ලංකාවේ කොළඹට ගෙනවුත් භාරදීම— මිළ රක්ෂණ හා ගැල්කුලිය සහිතව, ශ්‍රී ලංකා නාඋල තැනුම්පලට රෝද සවිකළ ගේට්ටු, කුණු රොඩු රඳවන රාමු සැපයීම හා සවිකිරීම සහ උමං කටෙහි පාලන පුවරු තත් ඇදීම හා ඒවා ක්‍රියාත්මක කරවීම ඇතුළු සාමාන්‍ය විදුලි හා යාන්ත්‍රික උපකරණ සවිකිරීම.

(ii) විද්‍යුත්-යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 2 නමින් හැඳින්වෙන කොන්ත්‍රාත්තුවට අඩංගුවන්නේ :—

ශ්‍රී ලංකාවේ නාඋල තැනුම්පලට ටර්බයින, ජනක යන්ත්‍රය, විදුලිබලාගාර දොඹකරය, ට්‍රාන්ස්පෝමර හා [illegible] ගියර සැපයීම හා සවිකිරීම, විදුලි පිලියනේ සහායක විදුලි හා යාන්ත්‍රික උපකරණ; සැකිලිවලට ගන්නා වානේ ඇතුළු වහරු බිම් උපකරණ : ටෙලි මීටර හා පණිවිඩ හුවමාරු උපකරණ සපයා ක්‍රියාකරවීම.

(iii) විද්‍යුත්-යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 3 නමින් හැඳින්වෙන කොන්ත්‍රාත්තුවට අඩංගුවන්නේ :—

අදාල සිවිල් වැඩ අතහැර පෙන්ස්ටොක්ස් ශ්‍රී ලංකා නාඋල තැනුම් පලෙහි සපයා සවිකිරීම.

එක එක කොන්ත්‍රාත්තුවේ උපලේඛනයන්හි ඇති සියලුම විෂයයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. එක එක කොන්ත්‍රාත්තුවේ ඇති විෂයයන්ගේ කොටසකට පමණක් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් සළකා බලනු නොලැබේ.

**විද්‍යුත් යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 1 (පහත දක්වෙන දේ අතහැර සපයා සවිකිරීම).**

1. කුණුරොඩු රඳවන රාමු දොළහක කට්ටලයක්. එක එක පැනලය සවිකළ කොටස් ඇතුළුව ආසන්න වශයෙන් අඩි 10 × 9½ උස (සැපයීම පමණයි.)

2. ගේට්ටු රැඳවුම් කණු නියමු කට්ටල දෙකයි. ආධාර කණු හා මතුපිට සහ උපාංග මුද්‍රා තැබීමේ ද්‍රව්‍ය (සැපයීම පමණයි.)

3. ගේට්ටු රැඳවුම් කණු හතරේ කට්ටල එකයි. එක රැඳවුම් කණුවක් ආසන්න වශයෙන් අඩි 12 × අඩි 8 උස. ඔසවන දණ්ඩ සහිතයි. (සැපයීම පමණයි.)

4. විවරයට රෝද සවිකල උමංකට ගේට්ටු එකයි. අඩි 12 × අඩි 18 උස. පීලි, නියමු, රාමුව, මුද්‍රා, ඔසොවි පාලන හා අනුබද්ධ කොටස් අනුනව.

5. එක කුණුරොඩු රඳවන රාමු රේක්කයක් හා උපාංග.

6. උමංකට ගොඩනැගිල්ලේ විදුලි ආලෝකය සැපයීමේ හා විදුලිය බෙදහැරීම් පද්ධතිය.

**විද්‍යුත් යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 2 (සපයා සවිකිරීම).**

1. '' ඩ්‍රාප්ට් ටියුබ් ලයිනර්ස් සහ පියර් නොසස් '' සහිත බී.එම්.පි. 56000 ටර්බයින එකක් සහ ''ගවනර්''.

2. අඩි 13ක් විෂ්කම්භය ඇති ටර්බයින ඇක්මං (සමනල වර්ගයේ) වැල්ව එකයි.

3. අඩි 18 අඟල් 3 ක් පළල අඩි 13 අඟල් 10 ක් උස විවර සඳහා ගැඹුරු ටියුබ ගේට්ටු රැඳවුම් කණු දෙකයි. රාමුව සහ උපාංග.

4. එහා මෙහා ගෙන යා හැකි තෙල් පෙරණ ඒකක එකයි.

5. කි.වො.ඇ. 47,100 ජනක යන්ත්‍ර එකයි. ලම්බාකාර යන්ත්‍ර දණ්ඩ ප්‍රධාන එක්ස්යිටරය, පාලන හා වෝල්ප හසුරුවන උපකරණය. වෙනත් උපාංග පතුල් තහඩු සහ ආධාර වෝල්ක.

6. ප්‍රබල ට්‍රාන්ස්පෝමර දහර ට්‍රාන්ස්පෝමර, අකුණු නිවාරක කැපැසිටර, අයම්බන්ධ කිරීමේ වහරුව හා ආවරණය අඩංගු ජනක යන්ත්‍ර ආරක්ෂක උපකරණ එකලසයයන් එකක්.

7. වගරු බෙදහරින ට්‍රාන්ස්පෝමර, රෙඩිස්ටර හා ආවරණය සහිත ජනක යන්ත්‍රය උදසීන බිම් ගැන්වීමේ උපකරණ එකලසයන් එකක්.

8. විදුලි පිලියන ඒ.සී. සහායක සේවාවන්.

9. විදුලි පිලියන ඩී.සී. සහායක සේවාවන්.

10. විදුලි පිලියක ඒකක මාන පුවරුව සහ ප්‍රධාන පාලන හා දර්ශක පුවරුව.

11. උපකරණ විදුලි පිලියනේ සවිකිරීම සඳහා පීලි, කේබල හා උපාංග සහිත අවලවත් ශක්තියකින් යුක්ත විදුලි බලාගාර දොඹකර එකක් (ඇස්තමේන්තු ගත ශක්ති ප්‍රමාණය (ටොන් 120, ප්‍රධාන කොක්, අනුබද්ධ කොකු ටොන් 10)

12. මධ්‍යස්ථාන සේවා වායු සම්පීඩනය හා සම්පීඩනය කළ වායු පද්ධතිය.

13. ''වැප්වේන්ජර්'', අකුණු වැලකුම් උපකරණ සහ උපාංගත් ගින්නෙන් ආරක්ෂා කිරීමේ සැටියත් අඩංගු කි.වො.ඇ. 48,000 තෙසැරි වෝල්ක.

14. 12,500/132,000 තෙල් බහාලූ එලිමහන් විදුලි ට්‍රාන්ස්පෝමර එකක්.

14. ජනක යන්ත්‍ර සැරි බස්/සැකිල්ල, වෙන්කොට තැබූ, ඇම්පියර 2,750 තෙසැරි ආසන්න වශයෙන් අඩි 100 ක්.

15. කි.වො. 132, මෙ.වො.ඇ. 2500 විදුලි සැරි සිඳහලු කට්ටල එකයි.

16. කණු තුනේ ක්‍රියාකරන ''ග්‍රවුන්සිං'' ''බෙල්ඩාස්'' සහිත කි.වො. 132 වා වහරු එකයි.

17. කි.වො. 132 පේලින් කැපැසිටර් වෝල්ක, ට්‍රාන්ස්පෝමර තුනයි.

18. කි.වෝ. 132 දගර ට්‍රාන්ස්පෝමර තුනයි.
19. වහරු බිමේ අකුණු ආරක්ෂක පද්ධතිය.
20. විදුලි මාර්ග වාහක උපකරණ.
21. විදුලි කොන්ඩියුට්ස්, කේබල් ට්‍රේ සහ අදාල උපකරණ.
22. ''කූලින්වෝටර්'' ක්‍රමය සහ ''සර්විස් වෝටර්'' ක්‍රමය.
23. වතුර ගිස් කිරීම හා ඩ්‍රෙනේජ් ක්‍රමය හා පොම්ප.
24. ඩීසල් පොරොත්තු ජනක යන්ත්‍රය හා උපකරණ.
25. වැඩපල උපකරණ.
26. ටෙලිමීටර හා පණිවුඩ හුවමාරු පද්ධතිය.
27. වතුර මට්ටම මණින උපකරණ.
28. උකුවෙල වහරු පොල ව්‍යාප්තිය—ස්විච්ගියර හා උපකරණ.

මුරගෙවල් 1 පාලන පැනල හා පී එල් සී උපකරණත් බිම් ගැන්වීමේ උපකරණත් ඇතුලති.

විද්‍යුත් යාන්ත්‍රික කොන්ත්‍රාත්තු අංක 3 (සපයා සවිකිරීම).

1. නැමී ඇතුළුව අඩි 14½ විශ්කම්භය ඇති වානේ පෙන්ස්ටොක් දිග අඩි 500 කට ආසන්න ගණනක්.

2. ''සර්ජ් චේම්බර් බෙලිමවුන්ට්'' විවරය.

කොන්ත්‍රාත්තු තුනට අදල නිමකළ යුතු දිනයන් හා වකවානු පහත පෙනෙන වක්‍රයේ පෙන්නුම් කරයි.

